Department of Education,Sabaragamuwa Province/ Weekly School

නිපුණතාවය 3 - මෙහෙයුම් පද්ධති පිළිබඳ අවබෝධය මගින් පරිගණකය කාර්යක්ෂම හා ඵලදායී අයුරින් භාවිත කරයි.

නිපුණතා මට්ටම 3.1 - පරිගණකයේ ක්‍රියාකාරීත්වය උදෙසා මෙහෙයුම් පද්ධතියක දායකත්වය ගවේෂණය කරයි.

## පද්ධති මෘදුකාංග -

පද්ධති මෘදුකාංග,පහත දැක්වෙන අංගවලින් සමන්විත වැඩසටහන්වල එකතුවකි.

- මෙහෙයුම් පද්ධති
- උපයෝගීතා මෘදුකාංග
- උපාංග ධාවක

### මෙහෙයුම් පද්ධතියක මූලික කාර්ය -

1.සම්පත් කළමණාකරණය - පරිගණක මතකය,සකසන කාලය,ආවයනය,මුද්‍රකය හා මොනිටරය වැනි ආදාන/ප්‍රතිදාන උපාංග ඇතුළු පරිගණකයේ සියලුම සම්පත් කළමණාකරණය සිදු කරයි.

2.පරිශීලක අතුරු මුහුණත ලබා දීම - අතුරු මුහුණත හරහා පරිශීලකට යෙදුම් මෘදුකාංග සහ දෘඩාංග සමඟ අන්තර් ක්‍රියා කිරීමේ ඉඩකඩ ලබා දේ.

### අභ්‍යාස -

1.අතුරු මුහුණත් වර්ග දෙක නම් කරන්න.

2.මෙහෙයුම් පද්ධති වර්ග නම් කරන්න.

3.ගොනු සහ ගොනු බහලු කළමණාකරණය යනු කුමක්ද?